**ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2017**

----------------------------------------------------------------------------------------------------------------

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මගින් දේපල පිරියත හා උපකරණ තුල ඇතුළත් විවිධ අයිතම (sundry item) ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 65 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.905,150 ක් වූ පරිගණක උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රාග්ධන ප්‍රදාන භාවිතා කර මිලදී ගත් වත්කම් වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීම වෙනුවට සම්පූර්ණ ප්‍රදානය වූ රු.4,944,768 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණු අතර එම ප්‍රදානයෙන් රු.157,000 ක් අයහාර වියදම් දැරීම සඳහා ද උපයෝගී කරගෙන තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ගණනය කිරීම් අනුව සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය රු. 1,517,117 ක් වුවද, රු. 1,503,927 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබීම හේතුවෙන් රු. 13,190 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ පිරිවැය රු.905,150 ක් වූ පරිගනක උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කිරීම හේතුවෙන් එම මූල්‍ය ප්‍රකාශන වල පරිගණක උපකරණවල වටිනාකම රු.226,288 අඩුවෙන් හා වාර්ෂික ක්ෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.8,557,029 ක් වූ උපචිත වියදම් ශේෂය තුල ඇතුළත් 2011 වර්ෂයේ සිට පැවත එන බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට ගෙවිය යුතු රු. 6,744,288 ක් හා 2014 වර්ෂයේ සිට පැවත එන සංග්‍රහ වියදම් රු. 62,000 ක් සහ විගණන ගාස්තු රු. 150,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත 10 වන වගන්තිය | ආයතනය විසින් නිලධාරීන්ගේ වැටුප රු. 25,000 ක් හෝ ඊට වැඩිවන විට රු. 25 ක මුද්දර ගාස්තුවක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කදිර්ගාමර් ආයතනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය වටිනාකම රු.16,080,355 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.446,290 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,797,868ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,244,158 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු ආදායම රු.7,043,746 කින් වර්ධනය වී තිබුණද, සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය වියදම් රු.8,005,415 ද, සේවක වියදම් රු.5,202,199 ද වැඩිවීම හා වෙනත් වියදම් රු.1,837,473 කින් වැඩිවීම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු 1,691,957ක අතිරික්තය 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී, 2017 වර්ෂයේදී රු 3,311,380ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු 12,436,454ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු 23,903,845ක් දක්වා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණ ද, 2017 වර්ෂයේදී එය රු 11,733,482ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

### 4.1 කාර්යසාධනය
-----------------

#### 4.1.1 සැලසුම් කිරීම
----------------

ආයතනයේ උපාය මාර්ගික සැලැස්ම තුළ පනතේ සඳහන් කර්තව්‍යයන් ඉටුකර ගැනීමට අදාළ වාර්ෂික කාර්ය සාධන දර්ශක හඳුනාගෙන තිබූ නමුත් එක් එක් දර්ශකය යටතේ ලඟා කරගත යුතු භෞතික ඉලක්ක නිශ්චිතව දක්වා නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භෞතික කාර්ය සාධන ඉලක්ක නොමැතිවීම හේතුවෙන් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ උපාය මාර්ගික අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා හා දේශන 15 , සම්මන්ත්‍රණ 06 සහ විෂය පථයට ගැනෙන කරුණුවලට අදාළව පළ කරන ලද වාර සඟරා හා ලිපි 37 හි ප්‍රමාණාත්මකභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා බණ්ඩාරනායක තානාපති පුහුණු ආයතනය විසින් රාජ්‍ය තාන්ත්‍රික හා ලෝක තතු පිළිබඳ ඩිප්ලෝමාව හා පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාවන් ද, වෙනත් රටවලින් ආරාධිත රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් හා විදේශ සේවයේ නිලධාරීන් ඇතුලු රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 03ක් හා අමාත්‍යාංශයේ නීති නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්ද පමණක් පවත්වා තිබුණි.

### 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ 2017 වර්ෂය වෙනුවෙන් සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණය ප්‍රකාරව භාණ්ඩ ඒකක 15ක ඌණතාවයක් හා භාණ්ඩ ඒකක 24 ක අතිරික්තය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ පවත්වනු ලබන වැඩසටහන් වෙනුවෙන් ශබ්ද විකාශන යන්ත්‍ර (Sound System) කුලී පදනම මත ලබා ගැනීම ආයතනයේ ක්‍රමවේදය වන අතර, සමාලෝචිත වර්ෂයේදී ද වැඩසටහන් 14 ක් සඳහා කුලී පදනම මත එම උපකරණ ලබා ගැනීම වෙනුවෙන් එකතුව රු. 834,500 ක් වැයකර තිබුණි. අදාළ උපකරණ කට්ටලයක් ආයතනයට මිලදී නොගැනීම හේතුවෙන් මෙවැනි වියදම් නිරන්තරයෙන් දැරීමට සිදුවීම වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයතනය විසින් නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.10,211,509 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (I) ඡේදය ප්‍රකාරව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයින්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා වැඩිකිරීම් පිළිබඳ විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට වාර්තා කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 07 ක් ප්‍රමාද වී 2018 ඔක්තෝබර් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

**5.2 විගණන කමිටු**

---

සමාලෝචිත වර්ෂයේදී විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබූ අතර, එම රැස්වීම් සඳහා ආයතනය හා බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය සහභාගී කරවාගෙන නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---

**5.3.1 ප්‍රසම්පාදනයන්**

---

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ (ඇ) ප්‍රකාරව ආයතනය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සිදුකල රු.1,790,551 ක් වූ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3, 6.2.2 හා 8.12.3 පරිදි ලංසු ආරාධනා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ලංසුකරුවන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා නොගැනීම හා ලැබුණු භාණ්ඩ පිරිවිතරයන්ට අනුව පවතින බවට තාක්ෂණික නිලධාරියෙකු සහතික කර නොතිබීම යන බැහැරවීම් නිරීක්ෂණය විය.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් 2006 පෙබරවාරි 23 දිනැති අංක අමප/06/0202/214/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (අ) වගන්තිය අනුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම මගින් කොළඹ 07 හෝර්ටන් පෙදෙස අංක 24 දරන ස්ථානයේ පිහිටි දේපලවල හිමිකාරත්වය ආයතනය වෙත පවරා දීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද එම දේපළ පවරා ගැනීමට විගණිත දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලද අතර ශාලාව හා උද්‍යානය වෙන්කිරීම හා අවලංගු කිරීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබීම හේතුවෙන් ශාලාව සහ උද්‍යානය කුලියට දීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.